ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2012 නොවැම්බර් මස 16 වැනි දින |

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 නොවැම්බර්**

මෙතෙක් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි ඵලදායී බව පිළිබිඹු කරමින් පුළුල් මුදල් සැපයුමෙහි සහ පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණයෙහි වර්ධනය වසරේ තෙවන කාර්තුවේ දී තියුණු ලෙස අඩු වූ අතර, 2009 දෙසැම්බර් මාසයට පසුව ප්‍රථම වතාවට සමුච්චිත වෙළෙඳ හිඟය ද 2012 පළමු මාස නවයේ දී අඩු විය.

මුදල් අංශයේ, පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2012 අප්‍රේල් මාසයේ දී වාර්තා කළ ඉහළම වර්ධනය වූ සියයට 22.9 සිට සැප්තැම්බර් මාසය වන විට සියයට 18.9 ක් දක්වා අඩු විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2012 මාර්තු මාසයට පෙර දක්නට ලැබුණු සියයට 35 ඉක්ම වූ ඉහළ වර්ධනයේ සිට සැප්තැම්බර් මාසය වන විට සියයට 25.5 ක් දක්වා අඛණ්ඩව පහත වැටුණි. 2012 පෙබරවාරි සහ මාර්තු මාසවල දී දක්නට ලැබුණු රුපියල් බිලියන 55 ඉක්මවූ මාසික වර්ධනයන්ට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි ප්‍රසාරණය රුපියල් බිලියන 10 කට වඩා අඩු අගයක පැවතුණි. රජයට ලබාදුන් ශුද්ධ ණය සහ රාජ්‍ය සංස්ථා වෙත ලබාදුන් ණය සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියේ අඩු අගයකින් වුවද, සමුච්චිත පදනම මත රාජ්‍ය අංශය විසින් ලබාගත් ණය පුරෝකථනය කරන ලද මට්ටම්වලට වඩා ඉහළ අගයක පැවතුණි. මෙම තත්ත්වය

තුළ, 2013 අයවැය කථාවේ ප්‍රකාශ කළ පරිදි, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අඛණ්ඩව පවත්වා ගෙනයාම සඳහා රජයේ කැපවීම ඉදිරි වසරවල දී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පහසු කරවනු ඇත.

විදේශීය අංශයේ, 2012 පළමු මාස නවය තුළ සමස්ත වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 6,780 ක් දක්වා සියයට 0.3 කින් සංකෝචනය වූ අතර මේ සඳහා දුර්වල ගෝලීය ඉල්ලුම හේතුවෙන් අපනයන ආදායම සියයට 5.8 කින් පහළ ගිය ද ආනයන වියදම සැලකිය යුතු ලෙස සියයට 3.3 කින් පහළ යාම හේතු විය. පහත වැටුණු වෙළෙඳ හිඟය මෙන්ම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක ලැබීම් සහ ප්‍රාග්ධන ලැබීම් ආදියෙහි ඉහළයාම් හේතුවෙන් 2012 සැප්තැම්බර් අවසානයේ දී ගෙවුම් ශේෂය එ.ජ.ඩොලර් මිලියන 269 ක අතිරික්තයක් වාර්තා කළ අතර දළ නිල සංචිත ආනයනික මාස 4.3 ක් ආවරණය කිරීමට ප්‍රමාණවත් වෙමින් එ.ජ.ඩොලර් බිලියන 7.1 ක් දක්වා ඉහළ ගියේය.

ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම මන්දගාමීව සිදුවීම නිසා ඉල්ලුම් තත්ත්වයන් දුර්වල වීම, යූරෝ කලාපයේ ඇතැම් රටවල රාජ්‍ය මූල්‍ය විනයක් ඇති කිරීම සඳහා වන විවිධ ක්‍රියාමාර්ග පිළිබඳව ඇති දේශපාලන මත ගැටුම් සහ ආර්ථික පරිහානිය මධ්‍යයේ සක්‍රීය නායකත්වයක් නොමැති වීම යුරෝ කලාපයේ ආර්ථික ස්ථායීතාවයට අඛණ්ඩවම අහිතකර බලපෑම් ඇතිකරමින් ගෝලීය ආර්ථික වර්ධනය ද අඩාල කරමින් පවතී. ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපතිවරණය නිමාවීමත් සමගම ගෝලීය ආර්ථිකය යථාතත්ත්වයට පත්කිරීම වේගවත් කිරීමට ඇමෙරිකා එක්සත් ජනපදය සහ යූරෝ කලාපය සාමූහික ප්‍රයත්නයක් දරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙවන් තත්ත්වයන් හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ උද්ගත විය හැකි කැළඹිලිකාරී තත්ත්වයන්ට මුහුණ දීම සඳහා දියුණු සහ නැගී එන ආර්ථිකයන් බොහොමයක මහ බැංකු විසින් ඔවුන්ගේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයන් ලිහිල් කර ඇත.

උද්ධමනය පහත වැටීමේ ප්‍රවණතාව ඔක්තෝබර් මාසයේ දී ද අඛණ්ඩව පැවතුණු අතර, පහත වැටුණු ආහාර ද්‍රව්‍ය මිල ගණන් හේතුවෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය සැප්තැම්බර් මාසයේ වූ සියයට 9.1 සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 8.9 ක් දක්වා ආන්තික වශයෙන් පහත

වැටුණි. අන්තර් මෝසම් වැසි ආරම්භ වීම නිසා කෘෂිකාර්මික නිෂ්පාදිතය ඉහළ යාමේ හැකියාවක් පවතින බැවින් ආහාර ද්‍රව්‍ය මිල ගණන් මත වන පීඩනය තවදුරටත් අඩුවීමේ ප්‍රවණතාවක් පවතී. ජලාශවල ජල මට්ටම ඉහළ යමින් පවතින බැවින් තාප විදුලි හා ජල විදුලි උත්පාදන අතර අනුපාතය සාර්ව ආර්ථිකයට වඩාත් හිතකර තත්ත්වයට පත්වී ඇත.

ඉහත සඳහන් කරන ලද ප්‍රවණතා පිළිබඳව සැලකිල්ලට ගනිමින් 2012 නොවැම්බර් මස 16 වැනි දින පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල රැස්වීමේ දී දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නොවෙනස්ව පවත්වා ගැනීම උචිත වන බව මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ඒ අනුව මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේම, එනම් ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 7.75 ක් සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 9.75 ක් ලෙස පවතිනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය සිදුකරනු ලබන දිනය යථාකාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.